# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/06/03/04/2022(212) | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.01. 24 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2022</u>**

"Monday Morning Interaction with Secretaries" මැයෙන් මා අමතන ලද දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/MMI හා 2023.01.08 දිනැති ලිපිය හා බැඳේ.

02. මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ අංක EC/EDR/LAE/2023/04 B හා 2023.01.05 දිනැති අංක 20 දරණ චක්‍රලේඛය මගින්, ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් 2023.01.18 දින සිට 2023.03.20 දින දක්වා අත්හිටුවිය යුතු බව දැනුම් දී ඇත.

03. ඒ අනුව, 2023.01.31 දිනට ක්‍රියාත්මක වීමට නියමිත 2022 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සියල්ල 2023.03.31 දක්වා කල් දැමීමට කටයුතු කරන ලෙසට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි දැනුම් දී ඇත.

04. එබැවින්, සේවා අවශ්‍යතාවය මත 2023.01.31 දක්වා දීර්ඝ කරන ලද සියලුම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් 2023.03.31 දක්වා කල් දැමීමට පියවර ගන්නා බැවින්, එකී සියලු ස්ථාන මාරුවීම් **<u>2023.04.01 දින සිට</u>** ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි.

05. ඒ අනුව, 2022 වාර්ෂික ස්ථාන මාරු ලද නමුත් සේවා අවශ්‍යතාවය මත 2023.01.31 දක්වා දීර්ඝ කරන ලද නිලධාරීන් වෙත ඒ බව දන්වමින් මා විසින් නිකුත් කරන ලද ලිපිවල අදාළ ස්ථාන මාරුව ක්‍රියාත්මක කරන දිනය **<u>2023.04.01</u>** ලෙස සලකා කටයුතු කරන ලෙසත්, නැවත ඒ සම්බන්ධයෙන් ලිපි නිකුත් නොකරන බවත් කාරුණික ව සිහිපත් කරමි.

06. තවද, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත ද මේ සම්බන්ධයෙන් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"